වැල්වැට්ටිතුරේ නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වැල්වැට්ටිතුරේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිත්‍යාග ලෙස සභාවට නිකුත් කරන ලද වාහන හයක් සභාවට අයිතිකරගෙන නොතිබුණි. කෙසේවෙතත් රු.1,640,500 ක් වූ ඒවායේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ බැවින්, එමඟින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මෝටර් රථ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී නිම කරන ලද කර්මාන්ත වෙනුවෙන් වෙන්කර තිබූ එකතුව රු.251,030 ක් වූ අතිරික්ත ප්‍රතිපාදනය මේ දක්වාම සමුච්චිත අරමුදලට බැරකර නොමැති බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදලද අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 අනුකූල නොවීම්
-------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------

එකතුව රු.3,747,336 ක්වූ දේපළ මත හිඟ තක්සේරු බදු අයකර ගැනීම සඳහා නගර සභා මූල්‍ය රීති මාලාවේ III පරිච්ඡේදයේ 54(2) වගන්තිය ප්‍රකාරව සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,127,614 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,831,328 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 790,000 | 433,639 | 764,485 | 3,747,337 | 800,000 | 350,518 | 766,922 | 4,782,089 |
| (ii) කුලී | 5,682,000 | - | 3,570,082 | - | 4,680,000 | - | 14,158,866 | - |
| (iii)බලපත්‍ර ගාස්තු | 738,500 | - | 839,645 | - | 835,000 | - | 703,026 | - |
| (iv)වෙනත් ආදායම් | 7,848,500 | - | 15,882,683 | 30,386,890 | 8,907,000 | - | 11,243,286 | 27,387,886 |
| එකතුව | 15,059,000 | - | 21,056,895 | 34,134,227 | 15,222,000 | 350,918 | 26,872,094 | 32,169,975 |

#### 2.2.2 වරිපනම් හා බදු

------------------

එකතුව රු.3,747,337 ක්වූ හිඟ වරිපනම් සහ බදු අයකරගැනීම සඳහා පසුගිය වසර 01 සිට වසර 14 දක්වා වූ කාලය තුළදී සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කාර්යසාධනය

---------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

අපද්‍රව්‍ය වෙන් කිරීම් නොකර, අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානවල ඒවා බැහැර කොට පිළිස්සීම හේතුවෙන් පරිසර දූෂණ තත්ත්වයක් පැවති බැව් නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්‍ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

(අ) මහජන පුස්තකාලයක් සහ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රැස්කළ එකතුව රු.7,228,327 ක්වූ මුදලක් අපේක්‍ෂිත කටයුතු සඳහා යොදා ගැනීමෙන් තොරව, පසුගිය වර්ෂ දෙක තුළ ස්ථාවර තැන්පතුවල තබා තිබුණි.

(ආ) මහජන උද්‍යානයක් සඳහා බදු පදනම මත සභාව විසින් ලබාගත් දේපළක් මේ දක්වාම අපේක්‍ෂිත කටයුත්ත සඳහා උපයෝගී කරගෙන නොතිබුණි. කෙසේ වෙතත් පසුගිය සිව් වසර සඳහා සභාව විසින් බදු ගාස්තු වශයෙන් රු.298,800 ක මුදලක් ගෙවා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

සභාව විසින් මානව සම්පත් විධිමත්ව බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොතිබූ බැවි නිරීක්‍ෂණය වුයෙන්, එවැනි මානව සම්පත් 09 ක් විසින් නිමකළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්‍ෂමතා

--------------------------

සභාවට අයත් හින්දු සුසාන භූමි 05 ක දේහ ආදහනය කිරීම සඳහා අවසර ලබාගෙන නොතිබුණි. ඒ සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගක් ගෙන නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

3.5.1 වත්කම් භාරදීමට අසමත්වීම

------------------------------

සභාව විසින් භාවිත කරනු ලබන ලැන්ඩ් කෲස් වාහනය සභාවට අයත් කරගෙන නොතිබුණි.

3.5.2 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

(අ) සභාවට අයත් වාහන තුනක් පසුගිය වසර 05 පුරාම නිෂ්ක්‍රියව පැවතිණි.

(ආ) වැල්වැටිතුරේ නව වෙළඳ පොළ සංකීර්ණයේ “ඒ” මහලේ පිහිටි කඩ කාමර 11 කුලියට දීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

4. වගකීම් භාරය සහ යහපාලනය

--------------------------------

4.1 අයවැය පාලනය

------------------

අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර රු.92,711 සිට රු.6,576,449 හෙවත් සියයට 03 සිට සියයට 101 දක්වා සහ අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර රු.3,279 සිට රු.6,018,843 දක්වා හෙවත් සියයට 05 සිට සියයට 15 දක්වා වූ පරාසයක විචලන නිරීක්‍ෂණය විය.

4.2 නිරාකරණය නොකළ විගණන ඡේද

--------------------------------------

ඉකුත් වර්ෂවල විගණන වාර්තාවල පෙන්වාදුන් පහත සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

| වර්ෂය | විගණන ඡේද අංකය | විගණන නිරීක්ෂණ |
| --- | --- | --- |
| 2012 සහ 2013 | 2.4.5 | නගර සභා ආඥා පනතේ 255 පරිච්ඡේදයේ 159(1) වගන්තියට පටහැනිව නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය සඳහා රු.74,330 ක වියදම් සභා අරමුදලින් ගෙවා තිබුණි. |

5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය. .

| පද්ධති | අඩුපාඩු |
| --- | --- |
| ගිණුම්කරණය | ඉඩම් විකුණුම මත බදු සඳහා වූ ලේඛනය නඩත්තු කිරීමට අසමත්වීම. |